# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2227/15 - 2021 මැයි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2021.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

### ජනාධිපති විධානය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් වර්ෂ 2021 ජනවාරි මස 07 දිනැති ජනාධිපති විධානය මගින් මහජන හිතකාමී ලෙස පවත්නා නීති රෙගුලාසි සරල කිරීම පිළිබඳ කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබූ හෙයින් ද,

එකී කොමිෂම වෙත පවරනු ලැබූ කාර්යයන් හා වගකීම සපුරාලීම සඳහා ලබා දී තිබූ කාලය 2021 අප්‍රේල් 07 දිනෙන් අවසන් වී ඇති බැවින් දි,

තවද, විනිවිදභාවයෙන් යුත් කාර්යක්ෂම, දූෂණයෙන් තොර සේවා සැපයීමක් සඳහා බාධාවක්ව පවතින නීති, රෙගුලාසි, චක්‍රලේඛ හා ක්‍රමවේදයන් සරල කරමින් කඩිනම් සේවා සැපයීමේ යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීම ඉතා කෙටි කලක් තුළ සිදු කොට අවසන් කළ යුතු බැවින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, උක්ත කොමිෂන් සභාවේ කාර්යයන් සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් තුළ කාර්යක්ෂම ලෙස සිදුකොට අවසන් කිරීම පිණිස කොමිෂන් සභාවේ කාලය 2021 අප්‍රේල් මස 07 වැනි දින සිට තවත් මාස තුනකින් දීර්ඝ කරමි.

වර්ෂ දෙදහස් විසිඑකක් වූ මැයි මස 12 වන දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. ජයසුන්දර,
ජනාධිපති ලේකම්.

05 - 459

1A - G 34344 — 385 (2021/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*